**ශීර්ෂය 103 -ආරක්ෂක අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 103 ආරක්ෂක අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් ගතකිරීම**

2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින්, රජයේ කාර්යාල ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමේ දී හා වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීමේදී ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ගිණුම් තැබීමේ ක්‍රියා පිළිවෙත හා සිගාස් පද්ධතිය තුළ ගිණුම් පවත්වා ගත යුතු ආකාරය හඳුන්වාදී ඇතත් අමාත්‍යාංශය විසින් එම පිළිවෙත් අනුගමනය කර නොතිබුණි. නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් 40 කට අදාලව 2023 දෙසැම්බර් 31 දිනෙන් ඉදිරි කාලපරිච්ඡේද වලට අදාලව ගෙවා තිබුණු රු. 580,498,346 ක වැඩ අත්තිකාරම් වියදම් වශයෙන් ගිණුම්ගතකර ඇති අතර ඉහතකී චක්‍රලේඛ උපදෙස් පරිදි කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් මගින් ගිණුම්ගතකර නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ගෙවනු ලබන අත්තිකාරම් මුදල්, වියදමක් වශයෙන් වැය ශීර්ෂයට හර කොට ඇති අතර පෙන්වා දි ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව දන්වා තිබුණි. | රජයේ කාර්යාල සඳහා ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමේ දී හා වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීමේදී 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කළයුතු වීම. |
| (ii) | අවස්ථා තුනකදී කාර්යාල ගොඩනැගිලි කුලී අත්තිකාරම් වශයෙන් එකතුව රු. 18,800,000 ක් ගෙවා තිබුණු නමුත්, මෙම අත්තිකාරම් ගෙවීම, කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම යන ගිණුම් මගින් නිරූපනය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන තුළින්ද අනාවරණය කර නොතිබුණි. | ගෙවනු ලබන අත්තිකාරම් සම්බන්ධයෙන් 250/2016(i) දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ සඳහන් උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2016 අගෝස්තු 13 දිනැති අංක 250/2016(i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |
| (iii) | ආපදා කළමනාකරණ අංශය විසින් බාහිර ආයතනයක් වෙත ලබාදී තිබුණු රු. 7,414,510 ක වැඩ අත්තිකාරම් මුදල්, වියදමක් ලෙස ගිණුම්ගතකර ඇතත් කුළි හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුළි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් මගින් ගිණුම් තැබීමක් සිදු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | 2016 අගෝස්තු 13 දිනැති අංක 250/2016(i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |
| (iv) | වැඩ කොන්ත්‍රාත් අත්තිකාරම් හා කාර්යාල ගොඩනැගිලි කුලී අත්තිකාරම් ගෙවීමේදී, ගෙවීම් සිදු කරන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත වීම හේතුවෙන් හා වැඩ අත්තිකාරමක් ලෙස සිගාස් | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම සකස් කර | කිසියම් දිනකට ජනරජ ගිණුමේ රජයට ඇති හිමිකම නිසිලෙස නිරූපණය වන පරිදි ගිණුම් පවත්වාගත යුතු |

පද්ධතිය තුළ ගිණුම්ගත නොවීම ගැනීමට අවශ්‍ය කටයුතු සිදු වීම.
හේතුවෙන් ජනරජ ගිණුමේ රජයට ඇති කරමින් පවතී.
හිමිකම නිසිලෙස නිරූපණය නොවන බව
නිරීක්ෂණය වේ.

**(ආ) දේපල පිරියත හා උපකරණ**

අංක 04/2018 හා 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛය හා එහි සඳහන් මාර්ගෝපදේශ අනුව, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර වාර්තා කල යුතු වුවද ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ මූල්‍යනය වන අනෙකුත් ආයතන විසින් පරිහරණය කරනු ලබන ඉඩම් අතරින් ගිණුම්ගතව පැවතියේ ජාතික ආරක්ෂක විද්‍යාතනය පිහිටා ඇති ඉඩමේ වටිනාකම පමණක් වන අතර ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ මගින් මූල්‍යනය වන අනෙකුත් ආයතන විසින් පරිහරණය කරනු ලබන ඉඩම් හඳුනාගැනීම, වටිනාකම තක්සේරුකිරීම හෝ ගිණුම්ගත කිරීම සිදුකර නොමැති බව පහත කරුණු අනුව නිරීක්ෂණය වන බැවින් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි ඉඩම් වටිනාකම නිරූපණය නොවුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2012 පෙබරවාරි 15 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණු ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිහිටි හෙක්ටයාර 21.0437 ක ඉඩම් කොටස තක්සේරු කිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය තුළද ප්‍රමාද වීම හේතුවෙන් ගිණුම් ගත කර නොතිබුණි.<br>. | 2012 පෙබරවාරි 15 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා දී තිබූ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිහිටි හෙක්.21.0437ක ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කටයුතු සිදු කරන අතර, පිඹුරුපත් සම්බන්ධයෙන් පවතින ගැටලු නිරාකරණය කර තක්සේරු කටයුතු සිදුකර 2024 වර්ෂයේ ගිණුම්ගත කිරීමේ හැකියාව පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කර නිවැරදිව ඉඩම් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව බලකාය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් කොටස් 35 ක් පවත්නා බවත් ඉන් කොටස් 04 ක අයිතිය ජාතික ශිෂ්‍ය භට බලකාය සතුව පවත්නා බවද, ඉතිරි ඉඩම් කොටස් 31 ක අයිතිය තහවුරුකර නොමැති බවත් වාර්තාගතව තිබුණි. මෙයින් එක් ඉඩම් කොටසක් 2021.12.31 දින වටිනාකම රු. 55,590,000 ක් ලෙස තක්සේරුකර ඇතත් එම ඉඩම් වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | ගිණුම්ගතව නොමැති රු.55,590,000 ක වටිනාකම නිවැරදිව හඳුනාගෙන මාස 03 ක් ඇතුලත ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කර නිවැරදිව ඉඩම් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය SA 82 ආකෘතිය අනුව අමාත්‍යාංශයට අයත් කාර්යාල ගොඩනැගිලි අගය රු.128,180,762 ක් දක්වා ඇතත් ඒ තුල 2021 ජුනි දක්වා අමාත්‍යාංශය පවත්වාගෙන ගිය අපහරණය කරන ලද ගොඩනැගිල්ලක වටිනාකමවූ රු.5,669,621 ක් ඇතුලත්ව තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලි වටිනාකම රු.5,669,621 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පැරණි අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ වටිනාකම CIGAS වැඩසටහන වෙතින් ඉවත් කිරිම සඳහා සටහන් කර ගන්නා ලදී. | අපහරණය කළ ගොඩනැගිලි වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කර CIGAS පද්ධතිය යාවත්කාලීන කළ යුතු වීම. |
| **(iv)** | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය දක්වා සිදුකරන ලද මූලධන වියදම් මගින් ගොඩනැගී ඇති ස්ථාවර වත්කම් සහ කෙරීගෙන යන වැඩ පිරිවැය මූල්‍ය ප්‍රකාශන හා SA 82 - මූල්‍ය නොවන වත්කම් වාර්තාව තුලින් නිරූපණය වී ඇතත්, පූර්ව වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ මූලධන වියදම යටතේ දරන ලද ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් ( 9152-61122- අනෙකුත් යාන්ත්‍රික උපකරණ) රු. 356,911,375 ක් සහ කෙරීගෙන යන වැඩ පිරිවැය (9160-61114) රු. 13,466,415,615 ක් මූල්‍ය ප්‍රකාශ තුළ SA 82 මූල්‍ය නොවන වත්කම් වාර්තාවට ඇතුලත්ව නොතිබුණි. | ව්‍යාපෘති වත්කම් නිසි පරිදි හඳුනාගැනීමෙන් හා තක්සේරු කිරීමෙන් පසු ප්‍රාග්ධනිත කිරීම සඳහා කටයුතු කිරීම යටතේ රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා ලබාදුන් 103-1-2-7-2509 වැය විෂය යටතේ වියදම් වාර්තා කිරීම සිදුකර ඇති බව දන්වා තිබුණි. | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ මූලධන වියදම් යටතේ ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම් සහ කෙරීගෙන යන වැඩ වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය වන පරිදි කටයුතු කළ යුතු වීම. |
| (v) | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළව SA 82 වත්කම් වාර්තාවේ දැක්වෙන ගොඩනැගිලි 06 ක වටිනාකම හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ දැක්වෙන එම ගොඩනැගිලි 06 හි වටිනාකම අතර රු. 1,528,485,726 ක වෙනසක් පවත්නා බව නිරීක්ෂණය විය. | SA 82 වාර්තාවේ දැක්වෙන්නේ 2021.12.31 තෙක් හඳුනාගත් වත්කම් අගයන් පමණි. නමුත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙතින් ලබා දී ඇති විස්තර පදනම්ව ගණනය කරන ලද වටිනාකම ඉදිරිපත් කර ඇත. පිරිවැය නිශ්චිතව ගණනය කිරීම සඳහා මණ්ඩලයක් පත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ගොඩනැඟිලි පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර වත්කම් කළමනාකරණ අවශ්‍යතා සඳහා ඉදිරිපත් කෙරෙන වාර්තාද ඒ මත පදනම් විය යුතු වීම. |
| (vi) | මූල්‍ය ප්‍රකාශන අනුව හා භාණ්ඩාගාර SA 82 ආකෘතිය අනුව (9151) ගොඩනැගිලි, (9160) - කෙරීගෙන යන වැඩ සහ ව්‍යුහයන්, (9152) - යන්ත්‍රෝපකරණ යන මූල්‍ය නොවන | 2024 වර්ෂයේදී මෙම වත්කම් ශේෂයන්ට අදාළව ලෙජර් ශේෂයන්හි නිවැරදි කිරීම් රාජ්‍ය ගිණුම් | භාණ්ඩාගාර පොත්පත් හා අමාත්‍යාංශ පොත්පත් එකිනෙක සැසඳෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල |

| | | | |
|---|---|---|---|
| | වත්කම්වල 2023 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 2,038,539,555 ක් වුවත් අමාත්‍යාංශයේ පොත් අනුව එකතු වටිනාකම රු. 10,618,850,752ක් වූයෙන් රු. 8,580,311,197 ක වෙනසක් පැවතුණි. ඒ අනුව භාණ්ඩාගාර පොත්පත් හා අමාත්‍යංශ පොත්පත් එකිනෙක නොසැසදෙන බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව හරහා සිදු කර ඇති බව දන්වා තිබුණි. | කළ යුතු වීම. |
| (vii) | 2022 සැප්තැම්බර් 15 දින පැවති විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මගින් අපහරණය කල යුතු බවට හදුනාගෙන තිබුණු පිරිවැය රු. 10,800,000 ක වාහන 06 ක් සමාලෝචිත වර්ෂයේදී යුධ හමුදාව හා නාවික හමුදාව වෙත පවරා දී තිබුණද, එම පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ වාහන වල අගය වැඩියෙන් දක්වා තිබුණි. | යුද්ධ හමුදාව සහ නාවික හමුදාව වෙත පවරා ඇති පිරිවැය රු.10,800,000 ක් වූ වාහන 06 2024 මැයි මස ගිණුම් සාරාංශය මඟින් ගැලපීම් සිදුකර ඇති බව දන්වා තිබුණි. | වාහන අපහරණයන් සහ පැවරීම් නිවැරදිව හදුනාගෙන ගිණුම් ගතකිරීමට කටයුතු කළ යුතු වීම. |
| (viii) | අමාත්‍යාංශ SA 82 මූල්‍ය නොවන වත්කම් වාර්තාව තුල ඇතුලත් කල්බදු වාහන දෙකක්, 2023 වර්ෂය තුල වෙනත් ආයතන වෙත පවරා දී තිබුණද CIGAS වත්කම් වාර්තාව තුලින් ඉවත් කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් රු. 35,900,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | යුද්ධ හමුදාව සහ නාවික හමුදාව වෙත පවරා ඇති පිරිවැය රු.35,900,000 වූ වාහන 02 මැයි මස ගිණුම් සාරාංශය මඟින් ගැලපීම් සිදුකර ඇත. | වෙනත් ආයතන වලට පවරාදී ඇති වාහන වටිනාකම CIGAS පද්ධතිය තුළ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ix) | ආපදා කළමනාකරණ අංශය විසින් වෙනත් අමාත්‍යාංශ හා ආයතන වෙත පවරා දී ඇති එකතුව රු.44,866,011ක වටිනාකමක් වූ රථවාහන 6ක් ආපදා කළමනාකරණ අංශයේ සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම්වල දක්වා තිබුණි. | වෙනත් ආයතන වෙත පවරා ඇති එම වාහන 2024 වසර තුල සිගාස් වැඩසටහනින් ගැලපීම් කර විගණනයට වාර්තා කිරීමට කටයුතු කරමි. | වර්ෂය තුළ වත්කම් සම්බන්ධයෙන් සිදුවන සංචලනයන් අප්‍රමාදව ගිණුම්තුළ ගැළපීමට කටයුතු කළ යුතු වීම. |
| (x) | 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 05/2023 හි උපදෙස් අනුව පරිගණක මෘදුකාංග වත්කම් අත්පත් කර ගැනීම් වැය කේත අංක 2106 යටතේ මෘදුකාංග පද්ධති අත්පත් කර ගැනීම් අස්පෘශ්‍ය වත්කම් ලෙස 61133 කේතය යටතේ වාර්තා කල යුතු වුවද රාජ්‍ය බුද්ධි සේවය සඳහා දත්ත කළමණාකරණ පද්ධතියක් සපයා සවි කිරීම සහ දත්ත විශ්ලේෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළව දරා තිබුණු රු.119,773,179 ක වියදම් යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීමේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | රාජ්‍ය බුද්ධි සේවාවේ දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල වියදම් වැරදීමකින් 61122 - වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ 6112202 - පරිගණක උපකරණ මිලදී ගැනීමක් ලෙස ප්‍රාග්ධනිත කර ඇති අතර අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත හැකි කොටස ඉදිරි ගිණුම් සාරාංශ මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | නිවැරදි ස්ථාවර වත්කම් කේතය අනුව අස්පෘශ්‍ය වත්කම් හඳුනාගත යුතු වීම. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නායයෑමෙන් නිවාස අහිමිවූ හා නාය යෑමේ අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් එම ස්ථානයෙන් ඉවත් කර ආරක්ෂිත ස්ථානයන්හි නැවත පදිංචි කිරීම පිණිස රු. 7,245,980,034 ක ප්‍රතිපාදන මත දිස්ත්‍රික් 18 ක නිවාස ඉදිකිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණද එයින් රු.3,112,989,366 ක ප්‍රතිපාදන ලබා දී තිබු දිස්ත්‍රික් 13 ක එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට ඉදිරිපත් නොකරන ලද දිස්ත්‍රික්ක 13ට අදාල තොරතුරු 2024.06.30 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ආපදා කළමනාකරණ අංශය වෙතින් දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 වගන්තියට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් තුලින් වර්ෂය තුල රැස්කල යුතු ආදායම රු.මිලියන 5,748 ක් ලෙස සඳහන් වුවත් වර්ෂය තුළ රු.මිලියන 10,124 ක ආදායමක් රැස්කර තිබුණු අතර ඒ අනුව සියයට 176 විචලතාවයක් පැවතීමෙන් ආදායම් ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාල රු.මි. 2,926 ක ආදායමක් 2023 වර්ෂයේදී භාණ්ඩාගාර ගිණුමට බැර වීම හේතුවෙන් 2023 වර්ෂයේ ආදායම රු.මි. 2,926ක ප්‍රමාණයක් ඉහළ ගොස් ඇත. නමුත්, මෙම ආදායම 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ දක්වා නොමැත. ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම තාත්වික ලෙස පිළියෙල කිරීමට සටහන් කරගෙන ඇත. | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාත්වික ලෙස පිළියෙල කළයුතු වීම. |
| (ආ) | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 ප්‍රකාරව රජයේ අයවැය ඇස්තමේන්තුව සකස් කිරිම සඳහා වාර්ෂිකව ආදායම් නිවැරදිව ඇස්තමේන්තු කළ යුතු බව දක්වා ඇතත්, මූලික ආදායම් | අය කළ ගාස්තු සංශෝධනය කිරීම, පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර හා අවසර පත්‍ර ගාස්තු ඉහළ දැමීම, නව බලපත්‍ර නිකුත් කිරීම, ගිණි අවි සම්බන්ධ ආදායම් ඉහළ යාම, දඩ මුදල් අය කර ගැනීම, | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාත්වික ලෙස පිළියෙල කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු හා සත්‍ය ආදායම අතර සියයට 130 සිට සියයට 147 දක්වා විචලනයන් පැවති අතර 2023 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතරද සියයට 36 සිට සියයට 91 දක්වා විචලනයන් පැවතුණි. | අධිකාරීත්වය මාරු කිරීම, 2022 වර්ෂයේ සාමසාධක ආදායම් 2023 වර්ෂයේදී ගිණුම්ගතවීම යනාදි හේතූන් මත ආදායම් වැඩිවීමක් සිදුව ඇත. | |
| (ඇ) | 2022 වසරට අදාලව එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් හිගහිටි ආදායමෙන් ඇ.ඩො.575,121 ක්, උපකරණ සපයා නොතිබීම හේතුවෙන් සත්‍ය වශයෙන්ම නොලැබෙන ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණු අතර එය මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව හිග ආදායම් කපාහැරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, 2023 ජනවාරි 01 දිනට හිග ආදායම ඉදිරියට ගෙන ඒමේදී අඩුකොට දක්වා තිබුණි. මෙම මුදල ආදායමෙන් අත්හැරීම සඳහා මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | උපකරණ සපයාදීමට නොහැකි වීම මත අපේක්ෂා කළ ආදායමක් උපයා ගැනීමට නොහැකිවීම හිඟ ආදායමක් ලෙස සලකා කපා හැරීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බැවින් මෙම නිරීක්ෂණය සමඟ එකඟ නොවේ. මේ පිළිබඳ තවදුරටත් උපදෙස් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙතින් විමසා පිළිතුරු පසුව වාර්ථා කිරීමට සටහන් කරගෙන ඇත. | 2022 වසරට අදාල හිගහිටි ආදායමක් ලෙස ගිණුම්ගතකර ඇති බැවින් හිග ආදායම් කපාහැරිමක් ලෙස හිඟ ආදායම් ප්‍රකාශය තුළ දැක්විය යුතු අතර මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වීම. |
| (ඈ) | මුදල් රෙගුලාසි 128(2)(උ) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතුකරනු ලබන දෙපාර්තමේන්තුවලින් අවශ්‍ය තොරතුරු ලබාගැනිමට ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු වුවත් ඒසිඒ-1(i) ආකෘතියෙහි දැක්වෙන රු.1,431,899,941 ක හිග ආදායම් රැස්කිරිමට අදාලවන මූලාශ්‍ර ලේඛණ ඉදිරිපත් නොවුණි. ඒ අනුව හිග ආදායම් එකතුකිරීම පිළිබඳ ප්‍රකාශය, අනුමත ආදායම් අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය, ආදිය ඉදිරිපත් නොවුණු බැවින් එක් එක් වර්ෂයට අදාළ හිග ආදායමට අනුරූපිව රැස්කල ප්‍රමාණය, මුදල් රෙගුලාසි 113 ට අනුකූලව අත්හරින ලද හිග ආදායම ආදිය නිශ්චිතව හඳුනාගත නොහැකි විය. | හිඟ ආදායම් එකතු කිරීම පිළිබඳ සහ අනුමත ආදායම් අත්හැරීම් ප්‍රකාශයන් ආදායම් රැස්කරනු ලබන ආයතන වෙතින් ගෙන්වා ගැනීමක් මෙතෙක් සිදු නොවූ අතර, මෙම වර්ෂයේ සිට හිඟ ආදායම් එකතු කිරීම පිළිබඳ සහ අනුමත ආදායම් අත්හැරීම් ප්‍රකාශය ආදයම් රැස්කරනු ලබන ආයතන වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි 128(2)(උ) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතුකරනු ලබන දෙපාර්තමේන්තුවලින් අවශ්‍ය තොරතුරු ලබාගැනිමට ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 14 ක් සඳහා රු. 19,230,000 ක ප්‍රතිපාදන සලසා ඇතත් එම සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | ආරක්ෂක අමාත්‍යවරයා ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍යවරයා ලෙස කටයුතු කිරීම හේතුවෙන් එම වියදම් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සිදු කිරීම හා 201/2023 හා 02/2023 ජාතික අයවැය චක්‍රලේඛ මගින් වියදම් දැරීම සීමා කිරීම ඉතිරිවීම් සඳහා හේතුවිය. | උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | වාර්ෂික ඇස්තමේන්තු මගින් වැය විෂයයන් 12 කට අදාලව ලබාගෙන තිබුණු වාර්ෂික ප්‍රතිපාදනය රු. 61,695,000 ක් වුවත් එම වැය විෂයයන් 12 සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ ලබාගෙන තිබූ අතිරේක ප්‍රතිපාදනය රු. 86,747,600 ක් වූයෙන්, මූලික ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස වැය ශීර්ෂයන් වෙත ලබාගත් අතිරේක ප්‍රතිපාදන වටිනාකම සැලකීමේදී සියයට 108 සිට සියයට 1503 දක්වා පරාසයක පැවතුණි. | 2023 වර්ෂය සඳහා ඉල්ලුම් කල ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබූ අතර, අනුමත අයවැය මගින් ලබාදුන් ප්‍රතිපාදන සීමා කර තිබුණි. 2023 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මු.රෙ 66 මාරු කිරීම් යටතේ ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. | උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව එක් එක් වැය විෂයය සඳහා සලසා ඇති ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වීම. |
| (ඇ) | වැය විෂයයන් දෙකක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් ලබාගෙන තිබුණු අතිරේක ප්‍රතිපාදනය රු. 2,064,600ක් වුවත් එම ප්‍රතිපාදනය ඉක්මවූ රු. 2,151,865 ක ඉතිරිකිරීම් පැවතිම. | මු.රෙ අනුව යම් බැඳීමක් ඇති කර ගැනීමට ප්‍රථම ප්‍රතිපාදන සලසා ගත යුතුය. ඒ අනුව අදාල වැය විෂයන් 2ට අදාලව ඉටුකල යුතු ප්‍රසම්පාදනයන්ට අදාලව ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරුකර ගැනීම සිදු කලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර වවුචර්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වීම මත එම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වී ඇත. | මාරු කරගත් ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි. 94 (2) හි විධිවිධාන අනුව පවත්නා මුදල් වර්ෂයේ ප්‍රතිපාදන පවතින විට ඊළග වර්ෂයේද එබඳු වියදම් අපේක්ෂා කෙරේ නම් ඊළග වර්ෂය තුල බේරුම් කිරීමට සිදු වන බැරකම් වලට එළඹිය හැකිය. 2024 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂාවකදී 2023 වර්ෂයට අදාළ අවස්ථා 39 කදී එකතුව රු. 3,106,817 ක් වූ වියදම් 2024 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බැරකම් වටිනාකම රු. 3,106,817ක් අඩුවෙන් දක්වා තිබුණි. | බැරකම් නිවැරදිව හඳුනා ගැනීමේ අපහසුතාවය මත එම ගෙවීම් බැරකම් ලේඛණයට ඇතුලත්වී නොමැත. මු.රෙ. ප්‍රකාරව හැකිතාක් දුරට බැදීම් හා බැරකම් හදුනාගෙන ලේඛණ වලට ඇතුලත් කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කරගෙන ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 94 (2) හි විධිවිධාන අනුව බැරකම් හඳුනාගෙන බැදීම් හා බැරකම් ලේඛණයෙහි ඇතුළත් කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 135 | - | මුදල් රෙගුලාසිය ප්‍රකාරව ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීම සිදුකලයුතු වුවත් එක්සත් ජාතින්ගේ සාමසාධක ආදායම හා බලපත්‍ර ගාස්තු ආදායමට අදාලව මූල්‍ය බලතල පවරා නොතිබුණි. | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීමක් මේ දක්වා සිදු කර නොතිබූ අතර, 2025 වර්ෂයේ මූල්‍ය බලතල | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | පැවරීමේදී ආදායම් සඳහා බලතල පැවරීම සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | |
| (ii) | මුදල් රෙගුලාසි - 453(ඉ) | | අමාත්‍යාංශය හා ආරක්ෂක සේවා යන අංශ දෙකෙහි කාර්යය මණ්ඩල සාමාජිකයන් 442 ක් හැරුණු විට අමාත්‍යාංශය විසින් වැටුප් ගෙවනු ලබන රාජ්‍ය බුද්ධි සේවාව හා ජාතික ශිෂ්‍යභට බලකාය යන අංශවලට අයත් නිළධාරීන් 2,292 ක් පිළිබඳව අනුමත/තත්‍ය කාර්යය මණ්ඩලය හෝ එහි මාසික වෙනස්වීම් පිළිබඳ පාලන වාර්තා පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී රාජ්‍ය බුද්ධි සේවයේ තොරතුරු මාසිකව ගෙන්වා ගැනීමටත් විධිමත් පරිදි පාලන වාර්තා පවත්වාගෙන යාමටත් අවශ්‍ය කටයුතු යොදන ලදී. | මුදල් රෙගුලාසි 453(ඉ) ප්‍රකාරව කටයුතු කර සම්පූර්ණ සේවක සංඛ්‍යාව පාලනය පිළිබඳ වාර්තා නිවැරදිව පවත්වා ගත යුතු වීම. |
| (ආ) | 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/8/ පොදු(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01. | 5,004,395 | 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සේවය කර ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරීන්, විශ්‍රාමික, මියගිය, වැඩ තහනම් කර ඇති නිලධාරීන් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 5,004,395ක් වූ අතර වර්ෂ 05 සිට වර්ෂ 20ට වැඩි කාල පරාසයක සිට අයවීම් හිඟහිට තිබුණු ශේෂ වල එකතුව රු. 1,297,832 ක් විය. | වර්ෂ 20 ට වැඩි අය කර ගත නොහැකි රු.590,703 ක් වූ ණය ශේෂ 03 ක් පොත් වලින් කපා හැරීම සඳහා යොමුකිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, වාරික වශයෙන් අයකර ගැනීම, ණය පියවන ලෙස අවසාන දැනුම්දීම් සිදුකිරීම, විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීම වැනි ක්‍රියාමාර්ග මඟින් හිඟ ණය අයකර ගැනීමට කටයුතු කෙරේ. | යොමුගත රාජ්‍ය මුදල් චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර හිඟහිටි ණය ශේෂ අයකර ගත යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2023 නොවැම්බර් 30 දිනැති, අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙ හි 8.2 ඡේදය | 3,911,702,668 | තවදුරටත් වාර්තාකළ යුතු වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හදුනාගෙන පිරිවැයට ගිණුම්ගතකළ යුතු වුවත්, 2021 මැයි 17 දිනට වැඩ නිම කර තිබුණු දැනට අමාත්‍යාංශය ස්ථාපිතකර ඇති ගොඩනැගිලි අංක 08 ට අදාළ පිරිවැය රු. 3,911,702,668 ක් ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර ඇතත් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලි වටිනාකම තුල මෙකී අංක 08 දරන ගොඩනැගිල්ලෙහි පිරිවැය ඇතුලත්කර නොතිබුණි. | එම වියදම කෙරීගෙන යන පිරිවැය යටතේ වාර්තා කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව තවදුරටත් වාර්තාකළ යුතු වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හදුනාගෙන පිරිවැයට ගිණුම්ගතකළ යුතු වීම. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සහතික නොකළ ගෙවීම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 138 හා 139 අනුව යම් කිසි වියදමක් දැරීමට පෙර වවුචර සහතික කර, ගෙවීම් කිරීමට බලය ලත් නිලධාරියා විසින් කටයුතු කල යුතු වුවද, බලය ලත් නිළධාරියා විසින් වවුචර සහතික කිරීමෙන් තොරව හා ගෙවීම් කිරීමට බලය ලත් නිලධාරියාගේ අනුමැතියෙන් තොරව රු. 2,055,345 ක් සුහසාධක අරමුදල් මගින් වියදම් කර තිබුණු අතර එම වියදම පසුව සුහසාධක අරමුදල් වෙත ප්‍රතිපූරණය කර තිබුණු බව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සහ ශිෂ්‍ය භට බළකාය යන ආයතන ආශ්‍රිත නියැදි පරීක්ෂාවන්හිදී නිරීක්ෂණය විය. | මු.රෙ.138 හා 139 හි දක්වා ඇති කරුණු වලට පටහැනිව සිදුකර ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන වවුචර්පත් සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදය මින් ඉදිරියට ක්‍රියාත්මක නොකිරීමටත් සියලුම මූල්‍ය රෙගුලාසි ආවරණය වන පරිදි මිලදී ගැනීම් සිදු කරන අදාළ ආයතන වෙත සෘජුව ගෙවීම් කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම හා ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි 138 හා 139 ප්‍රකාරව වවුචර සහතික කරන නිලධාරියා විසින් වවුචරයෙහි මුහුණත නම සඳහන් ගෙවීම් ලාභීන් ප්‍රස්තුත ගෙවීම් ලැබීමට හිමිකම් ඇත්තවුන් බවට හා ප්‍රතිපාදිත මුදල ඉක්මවා නොයන බවට තහවුරු කර ගතයුතු අතර ගෙවීම් කිරීමට බලය ලත් නිලධාරියකු විසින් වවුචර නිවැරදි ලෙස සහතික කර ඇත්දැයි තහවුරු කර ගැනීම, ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම ආදීය සම්බන්ධයෙන් වගවිය යුතු වීම. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කල විගසම අග්‍රිම ලබාගත් නිළධාරියා විසින් පියවීමට කටයුතු කල යුතු වුවත්, අවස්ථා 64 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු. 3,648,332 ක අත්තිකාරම් දින 25 සිට දින 200 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සහිතව පියවීම සිදුකර තිබුණි. | මේ සම්බන්ධව අදාළ අංශ හා ආයතන නැවත දැනුවත් කිරීමටත් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද අනුගමනය කිරීමටත් කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කල විගසම පියවීමට කටයුතු කල යුතු වීම. |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආරක්ෂක අමාත්‍යාංශය විසින් පොදු තැන්පතු ගිණුම් 06 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර එම ගිණුම් වලට අනුව 2023 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පතු ශේෂය රු. 894,999,209 ක්වූ අතර තැන්පතු කාළය වර්ෂ 2 සිට වර්ෂ 7 දක්වා වූ ශේෂ එකතුව රු.717,513,704 ක් විය. මුදල් රෙගුලාසි 571 ප්‍රකාර ඉකුත් වූ සියළුම තැන්පතු නියාදනය කිරීම සඳහා සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම මුදල් රෙගුලාසි 570 හි දක්වා ඇති පරිදි ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කල යුතු වුවද, එක් එක් අංශ වලට අදාල තැන්පතු ගිණුම් සම්බන්ධයෙන් එවැනි ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | මු.රෙ.571 ප්‍රකාරව ඉකුත් වූ සියලු තැන්පතු නියාදනය කිරීම සඳහා සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම මු.රෙ.570 හි දක්වා ඇති පරිදි ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් මෙම වර්ෂයේ (2024) සිට පිළියෙල කිරීමට කටයුතු කිරීම සඳහා සටහන්කර ගන්නා ලදී. | අදාල අවස්ථා වලදී මුදල් රෙගුලාසි 571 ප්‍රකාර ඉකුත් වූ සියළුම තැන්පතු නියාදනය කිරීම සඳහා අවශ්‍ය ලැයිස්තුවක් සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම පිළියෙල කල යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදය, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදවීම ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට සිදුව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 02 දෙනෙකු විසින් රු. 837,497,744 ක් හා එක්සත් ජනපද ඩොලර් 3,675,029 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් **(Claims for EOT)** 19 ක් ඉල්ලුම් කර තිබුණි.. | ව්‍යාපෘතියේ ඉදිරි පැවැත්ම සම්බන්ධයෙන් 2015 වසරේ පැවති අවිනිශ්චිතාව ඇතුළු විවිධ හේතූන් මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් මන්දගාමීවූ අතර මෙම ප්‍රමාදයන් මත කොන්ත්‍රාත්කරුවන් විසින් කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් ඉල්ලුම් කර ඇත. එය ව්‍යාපෘතිය මගින් පාලනය කල නොහැකි තත්ත්වයක් බව පෙන්වා දෙමි. | අනාර්ථික වියදම් ඇතිවීම වලක්වා ගැනීම හා අනවශ්‍ය ප්‍රමාදයන් පාලනය කරගැනීමට ප්‍රමුඛතාව දිය යුතු වීම. |

### 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික ආපදා සහන සේවා මෙහෙයුම් යටතේ ක්‍රියාත්මක නායයෑමෙන් නිවාස අහිමිවූ හා නායයෑමේ අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් එම ස්ථානවලින් ඉවත් කර ආරක්ෂිත ස්ථානයන්හි නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ රජයේ මූල්‍ය ආධාර මත නිවාස ඉදි කර තිබූ දිස්ත්‍රික්ක 3ක පිහිටි නිවාස 205 ක් සඳහා ජල මූලාශ්‍ර නොමැතිකම හා දිස්ත්‍රික් 3ක පිහිටි නිවාස 82ක් සඳහා විදුලිය පහසුකම් නොතිබීම හේතුවෙන් එකතුව රු.344,400,000ක මූල්‍ය ආධාර ලබාගත් ප්‍රතිලාභීන් ඒම නිවාස වල පදිංචි වී නොතිබුණි. තවද එකතුව | නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉදිකරන නිවාස සඳහා ජලය හා විදුලිය අදාළ ප්‍රතිලාභීන් විසින් සපයා ගත යුතු බවත්, රටතුළ පවතින ආර්ථික තත්ත්වය හමුවේ නැවත පදිංචි කරන සියලු ප්‍රතිලාභීන් සඳහා මෙසේ ජලය හා විදුලිය ලබා දීමට හැකියාවක් නොමැති බවත් සඳහන් කරමි. ජල මූලාශ්‍ර නොමැති අවස්ථාවන්හිදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන විසින් ජලය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. | ආරක්ෂිත ස්ථානයන්හි පුද්ගලයන් පදිංචි කිරීමේදී ජලය , විදුලිය වැනි මූලික අවශතා සපුරාගත හැකිවන පරිදි යටිතල පහසුකම් පවතින ස්ථානවල පදිංචි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.15,900,000 ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 17 දෙනෙකු විසින් එම නිවාසවල සහ ඉඩම්වල හිමිකම අතහැරදමා තිබුණි. | | |
| (ආ) | දිස්ත්‍රික්ක 05ක ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ ඉහත වැඩසටහන යටතේ එකතුව රු.200,600,000 ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 258 දෙනෙකු ප්‍රතිලාභ ලබාගත් අදියරට අදාල කාර්යයන් ඉටුකිරීමකින් තොරව ඉදිකිරීම් කටයුතු අත්හැරදමා තිබුණු අතර එකතුව රු. 82,700,000ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 90 දෙනෙකු ප්‍රතිලාභ ලබාගත් අදියරට අදාල කාර්යයන් පමණක් ඉටුකර ඉදිකිරීම් කටයුතු අත්හැරදමා තිබුණි. | වාරිකයට අදාළ ඉදිකිරීම් සිදු නොකිරීම, වාරිකයට අදාළ ඉදිකිරීම් පමණක් සිදුකර නිවසේ ඉදිකිරීම් අත්හැරීම, අධි අවදානමේ පවතින නිවස කඩා ඉවත් කළයුතුවීම මත හතරවන වාරිකය ලබා නොගැනීම,අමු ද්‍රව්‍ය වල මිළ ඉහළ යෑම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සිදුනොකිරීම ආදිය මේ සඳහා හේතුවී ඇත. | විධිමත් අධීක්ෂණයක් සහිතව ව්‍යාපෘතියේ මූලික අරමුණු ලඟාකර ගැනීම සඳහා කටයුතු කළයුතු වීම. |
| (ඇ) | ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ වැඩසටහන මගින් නිවසක් සහිත ඉඩමක් මිළදිගැනිම සඳහා එකතුව රු.9,600,000 ක ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයන් 06 දෙනෙකු විසින් එම මුදල් භාවිතාකර ඉඩම් මිලදී ගෙන නොතිබුණි. | ප්‍රතිලාභියා විදේශ ගත වීම, ගිවිසුමට අදාළ නිවස මිලදී ගෙන නොමැතිවීම, ඉඩම අන්සතු කිරීම, ඉඩම් ගැටලු හේතුවෙන් මිලදී නොගැනීම, ඉඩමක් මිලදී නොගෙන පියාට අයත් ඉඩමක නිවස ඉදිකිරීම යනාදිය මේ සඳහා හේතුවී ඇත. | ප්‍රතිලාභ මුදල් අදාල කාර්යයට යොදන බවට තහවුරුවක් සහිත වගවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළයුතු වීම. |

**3.3 ප්‍රසම්පාදනයන්**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2023 සැපයුම් වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවේ කඳවුරුගත සාමාජිකයන් 151,429 ක් වෙනුවෙන් අමු හා වියළි ආහාර සැපයීම සඳහා අමාත්‍යාංශය විසින් රු. බිලියන 96 ක වැය ඇස්තමේන්තුවක් මත ලංසු පිරිනමා තිබුණු අතර ත්‍රිවිධ හමුදා විසින් මෙම ආහාර ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳව ඒකාකාර හා නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර විවිධ පදනම් මත ආහාර ඇස්තමේන්තු සකස් කර තිබුණි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ | ඇස්තමේන්තු අනුව එක් පුද්ගලයෙකුගේ වාර්ෂික සහල් අවශ්‍යතාවය කි.ග්‍රෑම් 181.480 ක් වුවත්, කි.ග්‍රෑම් 37.820ක වැඩිපුර සහල් අවශ්‍යතාවයක් සකස් කිරීම තුළින් යුද්ධ හමුදා භටපිරිස් හට අඛණ්ඩව ආහාර සැපයීම සිදුකළ හැකි අතර, කොළඹ ප්‍රදේශය තුළ පැවරී ඇති අභ්‍යන්තර ආරක්ෂක, ප්‍රභූ ආරක්ෂක රාජකාරී හා උත්සව, උද්ඝෝෂණ වෙනත් රාජකාරී | පූර්ව වර්ෂ වල සත්‍ය පාරිභෝජනයද සැලකිල්ලට ගනිමින් තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පුද්ගලයකුගේ දෛනික සහල් අවශ්‍යතාවය ග්‍රෑම් 190ක් ලෙස සම්මතයක් පවත්වාගනු ලැබුවද ඇස්තමේන්තු සකස් කිරීමේදී ග්‍රෑම් 633ක් ලෙස ගණනය කර තිබුණු අතර එක් නාවික හමුදා සාමාජිකයෙකුගේ එක් දිනක ආහාර අවශ්‍යතාවය සහල් ,ධාන්‍ය, එළවළු, මස් ,මාළු සහ කරවල ඇතුළු ආහාර වර්ග 140 කින් කි.ග්‍රෑ. 27 යි ග්‍රෑම් 590 ක් බවට අතාත්වික හා අධි ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. | තත්වයන් හා හට පිරිස් තුළ වාසී කිරීමට සිදු වීම සැලකිල්ලට ගෙන ඇස්තමේන්තුපත් සකස් කිරීමට කටයුතු කර ඇත. | |
| (ආ) | ත්‍රිවිධ හමුදාවේ කඳවුරුගත සාමාජිකයන්ට අහාර සැපයීමට අදාළ ලංසු ඇගයීමේදී ආහාර ද්‍රව්‍යය සඳහා සාධාරණ මිලක් තීරණය කර එම මිල මත සියයට 10 ක උපරිමයක් වන පරිදි දිවයිනේ කුමන හෝ කඳවුරකට සැපයීම සඳහාවූ උපරිම මිල තීරණය කරන බවත් ඒ සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනය හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් එක්රැස් කල මිලගණන් පිලිබඳ දත්ත හා ත්‍රිවිධ හමුදාවන් විසින් සිදුකරනු ලබන මිල සමීක්ෂණ පදනම් කරගත් බවට දක්වා තිබුණි. හඳුනාගත් සාධාරණ වෙළඳපල මිලට වඩා සියයට 22 සිට සියයට 103 දක්වා වැඩි මිලකට කොළඹ හා තදාසන්න ප්‍රදේශවල කඳවුරු 05 කට සහල් වර්ග සැපයීමට ලංසු පිරිනමා තිබූ අතර එම කඳවුරු 05 සඳහා පරිප්පු, කරවල හා කිරිපිටි සැපයීම හඳුනාගත් සාධාරණ වෙළඳපල මිලට වඩා සියයට 42 සිට සියයට 102 දක්වා වැඩි මිලකට ලංසු පිරිනමා තිබුණි. | අවම ලංසු අගය ඉදිරිපත් කල පමණින් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා අනුමත නොකරන අතර, එම මිල ගනන් වෙළෙඳපලේ පවතින මිල ගනන් හා සැසඳීමේදී සාධාරණද යන්න සලකා බලනු ලබයි. එසේ නොවන අවස්ථා වලදී මිල සාකච්ඡා මඟින් අවම ලංසුකරුගේ මිල ගනන් සාධාරණ අගයක් දක්වා පහළට ගෙන ඒමට හැකි සියළුම උත්සාහයක් ගනු ලබයි. නමුත් අමාත්‍යාංශය පවරන මිලක් යටතේ සැපයීම් කිරීමට සැපයුම්කරුවන් එකඟ නොවන අතර එවැනි මිල පැවරීමක් සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදනද නොමැත. ඒ අනුව, තාක්ෂණික ඇගයුම් කමිටුව සාධාරණ වෙළඳපල අගයක් පිළියෙල කල පමණින් එම මිලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට හැකියාවක් නොමැත. | රජයට අවම පිරිවැයක් දැරීමට සිදුවන අයුරින් හා උපරිම වාසි සැලසෙන අයුරින් කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 876.84 ක් වූ ගොඩනැගිලි 03 ක ගෙබිම හා පැන්ට්‍රි මතුපිට ග්‍රැනයිට් ටයිල් සපයා සවි කිරීමේ කාර්යය, ප්‍රසම්පාදන කාර්යයන් 03 ක් ලෙස ඛණ්ඩනය කර ලංසු කැඳවා තිබුණු නමුත් එම කොන්ත්‍රාත් ත්‍රිත්වය එක් කොන්ත්‍රාත්කරුවකු වෙත | වෙන් වශයෙන් කාර්යයන් ඉටු කිරීමෙන් ඒ ඒ හමුදාවන් හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත අවසාන වගවීම භාර ගැනීම හා පවත්වාගෙන යාම පහසුවීම, කොන්ත්‍රාත් කළමණාකරණය කිරීමේදී ඇති වන දුෂ්කරතා හා සංකීර්ණතා, අවමකර ගැනීම, මධ්‍යම පරිමාණ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **3.12** ප්‍රකාරව ලංසුකරුගේ මූල්‍ය, තාක්ෂණික, නිෂ්පාදන, කාර්යසාධන, ප්‍රමිතීන් පිළිබඳ පූර්ව සුදුසුකම් ඇගයීමට ලක්කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පිරිනමා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 ප්‍රකාරව ලංසුකරුගේ මූල්‍ය, තාක්ෂණික, නිෂ්පාදන, කාර්යසාධන, ප්‍රමිතීන් පිළිබඳ පූර්ව සුදුසුකම් ඇගයීමට ලක්කළ යුතු වුවත් රු. මිලියන 927.66 ක්වූ කොන්ත්‍රාත් කාර්යයන් තුනක් එකවර ඉටුකිරීම සඳහා ලංසු කරුගේ තාක්ෂණික, මූල්‍ය හා මානව සම්පත්, උපකරණ ධාරිතාවයන් හා හැකියාවන් පිළිබඳව විධිමත් ඇගයීමක් සිදුකර නොතිබුණු අතර අනුමත කොන්ත්‍රාත් කාලය මෙන් තුන් ගුණයකට අධික කාලය දීර්ඝ කිරීම් අවස්ථා 04ක් ලබාදී ඇතත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් වැඩ අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ටද අවස්ථාව ලබා දීම, වැඩි තරගකාරිත්වයක් ඇති කිරීම, ව්‍යාපෘතියේ ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් ඇගයීමට හැකිවීම, ඉල්ලුම් කළද ප්‍රතිපාදනයට වඩා අඩු ප්‍රතිපාදන ලැබීම, ස්ථානගත කිරීමේ ප්‍රමුඛතාවයන් වෙනස් වීම වැනි කරුණු හේතුකොට ගෙන ගොඩනැගිලි සඳහා වෙන වෙනම කොන්ත්‍රාත්තුන් භාරදී ඇත. එකම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් කීපයක් සමගාමීව සිදු කල හැකිද යන්න පරීක්ෂා කිරීම ආරක්ෂක අමාත්‍යාංශ උපදෙස් මත සිදු කරන බව දන්වමි. | |
| (ඇ) | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ අංක 03 හා 04 ගොඩනැගිලි සඳහා අඩු වෝල්ටීය ඉලෙක්ට්‍රොනික පද්ධතියක් නිර්මාණය කර සපයා සවි කිරීමේ කාර්යය, කොන්ත්‍රාත් කාර්යයන් දෙකක් ලෙස ලංසු කැඳවා තිබුණු නමුත් එම කොන්ත්‍රාත් ද්විත්වය එක් කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.12 අනුව කොන්ත්‍රාත් කිහිපයක් එකවර ඉටුකිරීම සඳහා ලංසුකරුගේ තාක්ෂණික, මූල්‍ය හා මානව සම්පත් ධාරිතාවය ඇගයීම් කල යුතු වුවද, එකග වූ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 642 ක සැපයුම් සේවාවන් එකවර ඉටු කිරීම සඳහා තෝරා ගත් ලංසුකරු වෙත අවශ්‍ය සම්පත් ධාරිතාවය (මූල්‍ය, තාක්ෂණික, නිෂ්පාදන, කාර්යසාධන, ප්‍රමිතීන්) පවතීද යන්න පිළිබඳව පූර්ව සුදුසුකම් ඇගයීමට ලක්කර නොතිබුණි. | එක් විෂයයක් යටතේ කොන්ත්‍රාත් කීපයක් සිදු කිරීමට සිදුවන අවස්ථාවකදී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර එකම කොන්ත්‍රාත්කරුවකුට කොන්ත්‍රාත් කීපයක් සමගාමීව සිදු කල හැකිද යන්න පරීක්ෂා කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ. | රු. මිලියන 927.66ක කොන්ත්‍රාත් කාර්යයන් එකවර ඉටුකිරීම සඳහාත් අපේක්ෂිත කාලරාමුව තුළ නිමකිරීම සඳහාත් කොන්ත්‍රාත් කරුගේ පවතින තාක්ෂණික සහ සම්පත් ධාරිතාවය පිළිබඳව විධිමත්ව ඇගයීම සිදුකළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ තනතුරු 118 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු 28 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. මෙම තත්ත්වය අමාත්‍යාංශයේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමේදී බාධාවක් වී තිබුණි. | අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින්නා වූ ඒකාබද්ධ සේවාවන්ගේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් ගණනාවක් කර ඇත. | අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතු වීම. |
| (ආ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 4/2017 අනුව සෑම කාර්තුවක් අවසානයේදීම තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් උක්ත චක්‍රලේඛය පරිදි අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2023 සිව්වන කාර්තුවට අදාළ යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව යොමු කරන බව වැඩි දුරටත් දන්වා සිටිමි. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 4/2017 අනුව කටයුතු කළ යුතු වීම. |